# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# උතුරු පළාත

## පළාත් මට්ටමේ අවසාන පොදු වාර පරීක්ෂණය -2014

**සිංහල භාෂාව හා සාහිත්‍යය**

**III කොටස**

ශ්‍රේණිය 11 — කාලය පැය 1යි

විභාග අංකය ...................................... — ලකුණු

- **ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **1,2,3,4 ප්‍රශ්න වලටත් 5,6,7 ප්‍රශ්න වලින් එකකටත් පිළිතුරු සපයන්න.**
- **කාලය පැය 02 යි. මෙම ප්‍රශ්නපත්‍රයට නියමිත ලකුණු 80 කි.**

---

**1) අංක I සිට X දක්වා ඇති සියළුම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉරක් අඳින්න.**

I. **"මේ මා ලද පළමු සැපත නුඹවහන්සේ මා වැඩි පොසාවනික මිලයට ගෙන වදාළ මැනව"**
**(අ) මෙහි "සැපත" යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?**
**(ආ) "නුඹවහන්සේ" යන්න යෙදී ඇති පුද්ගලයාගේ නම ලියන්න.**

II. **"ඕකට තමයි මිනිහා සූට්බූට් ගහලා ආවේ"**
**(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක්ද?**
**(ආ) මෙහි සඳහන් අය හොඳින් ඇඳපැලැඳ ගෙන පැමිණීමට හේතුව කුමක්ද?**

III. **"ඇවිළෙමින් සිටි පානින් කෙතෙක් පාන් ඇවුළුවත් පාන්කුඩ තෙල් ගෑවී ශෝභාව බලවත් වන්නා සේ"**
**(අ) මෙම පාඨය සමග බැඳුනු අවස්ථාව කෙටියෙන් ලියන්න.**
**(ආ) මෙම කොටස උපුටාගත් මුල් කෘතියේ රචකයා කවුද?**

IV. **"දුප්පත් මිනිහෙකුට මේ ලෝකෙ කිසිම හවිහරනක් නෑ"**
**(අ) මෙම ප්‍රකාශය ශ්‍රවනය කළේ කවරෙක්ද?**
**(ආ) මෙසේ ප්‍රකාශ කිරීමට හේතු වූයේ කුමක්ද?**

V. **"<u>වතින් සොමි</u>            <u>සඳවූ</u>**
**රන්ලිය සිරින්            බඳවූ"**
**(අ) මෙම කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.**
**(ආ) ඉරි ඇඳි කවි පදයේ අදහස ලියන්න.**

VI. **"තොපි හලාහල විෂයටත් වඩා ඉතා උග්‍ර වූ වර්ග විනාශයට කාරන වූ නිධාන තබාගෙන ප්‍රයෝජන විඳුද?"**
**(අ) මෙහි සඳහන් "වර්ග විනාශය" යනු කුමක්ද?**
**(ආ) මෙම පාඨය උපුටාගත් මුල් කෘතිය කුමක්ද?**

VII. **පොළොවට වැටෙන හැම වැහි බිඳුවකම            පහේ**
**ගැබ්වුණු සිසිල එහි ඊතල පරිදි            මෙහේ**
**(අ) මෙම පද්‍ය ඛණ්ඩය ඇතුළත් පැදි පෙළේ රචකයා කවරෙක්ද?**
**(ආ) මෙහි සඳහන් උපමාව උපුටා දක්වන්න.**

VIII. **"ඉදින් තොපට වස්තුවෙන් ප්‍රයෝජන ඇත්නම් කලක් ඉවසව"**
**(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක්ද?**
**(ආ) ප්‍රකාශයෙන් අනතුරුව ඇති වූ සිදුවීම කෙටියෙන් ලියන්න.**

IX. **"රෑ හුගාක් වෙලා යනකල් මට නින්ද ගියේ නෑ"**
**(අ) මේ ප්‍රකාශය හා සබැඳි අවස්ථාව කුමක්ද?**
**(ආ) මෙම ප්‍රකාශය උපුටා ගත් කතාව ලියැවී ඇති දෘෂ්ටිකෝණය කුමක්ද?**

X. **පහත සඳහන් ග්‍රන්ථ රචනා වූ යුග නම් කරන්න.**
**(අ) සද්ධර්මාලංකාරය**
**(ආ) යශෝදරාවත**

**(ලකුණු 20 යි)**

The National e-learning Portal for The General Education

2) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨවල ඉරි ඇඳි පද වල අර්ථය වෙන් වෙන්ම ලියා අනතුරුව මුළු කොටසේම සමස්ථ අර්ථය ලිහිල් බසින් ලියන්න.

I. හමන සුවඳ සිහිලස ලිය මඩුලු වලා
ගිමන නිබඳ සතපා උනිමු ලොබ වලා
එවන මෙසඳ තැවුලිය ළැව් ගිණි සෙවලා
කුමන සැපද වින්දේ හිමි සමඟ වලා

II. "ස්වාමිනී, මේ මිනිස් ලොව නම් පූර්වයෙහි ඖෂධයෙන්ම මවන ලද වන ඖෂධ ඝටිකාවක් වැන්න. ඖෂධයට නෙගත හැකි වස්තුවක් නොලද්දෙමි" යි කීහ.

III. "මසු ලක්ෂයක් දීලා පිළිවහන මුවා නහන කොටුවක් කැරවූහ. එසේම මසු ලක්ෂයක් දීලා නාන්ට දැවාණමය පෝරුවක් කැරවූහ."

IV. "එකලැ මේ ලංකාද්වීපයෙහි මනුෂ්‍යයෝ පස් හැවිරිදි කුමාරවරුන් තමතමන් විභවානුරූපව නොයෙක් ආභරණයෙන් සරසා මහත් වූ මඟුලෙන් ශික්ෂාග්‍රහණය කරවති."

(ලකුණු 2 බැගින් 8 කි)

3) "සිදුවු සෙයින් අදහස" පද්‍ය පන්තිය වඩාත් සාර්ථක වී ඇත්තේ

I. කිසියම් අවස්ථාවක් සජීවී ලෙස ඉදිරිපත් කිරීම.
II. සරළ බස් වහරක් යොදා ගැනීම.

යන කරුණු නිසාය එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.

(ලකුණු 15 යි)

නැතහොත්

I. ස්වභාවෝක්තිය පාදක කර ගැනීමත්
II. අජීවී පරිසර සාධකයට සජීවත්වයක් ආරෝපණය කිරීමත් නිසා වසන්ත සමයෙහි විද්‍යාමාන පාරිසරික චමත්කාරය භාව ප්‍රබෝධයට හේතුවන අයුරින් කවියා විවරණය කරයි. එක් කරුණකට නිදසුන් දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

4) සද්ධර්මරත්නාවලී කතුවරයා තම කතාවස්තු රචනයේ දී

I. සරල බස් වහරක් යොදාගැනීම.
II. උචිත උපමා රූපක යොදාගැනීම.
III. කෙරෙහි දක්වා ඇත්තේ මනා කුශලතාවයකි. භක්ත භක්තික කථා වස්තුව තුළින් එක කරුණකට නිදසුන් දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

නැතහොත්

සද්ධර්මාලංකාරය රචනා කිරීමේ දී

I. සාමාන්‍ය ජනතාවට ධර්මය අවබෝධ කරවීමටත්
II. දහම් මඟට ඔවුන් යොමු කිරීමටත්
III. පරමාර්ථ කොටගත් බව පැහැදිලිය. එක් කරුණකට නිදසුන් දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

- **5, 6, 7 ප්‍රශ්න වලින් එකකට පමණක් පිළිතුරු සපයන්න.**

5) වෛද්‍යවරයෙකු සතු දැනුම් සම්භාරය හා සදාචාරාත්මක ගුණ සමුදය ජීවක කතාවස්තුව තුළින් විවරණය වේ. උදාහරණ තුනක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

6) නාටෝචිත අවස්ථා බහුලව යොදා ගැනීම නිසා "මඟුල් ප්‍රස්ථාව" නාට්‍යය රසවත් වී තිබේ. උදාහරණ තුනක් දෙමින් මේ කියමන පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

7) "මහාමායා දේවිය දුටු සිහිනය" පද්‍ය පන්තිය පුරාම දැකිය හැක්කේ ගැමි ජනතාවට හුරු පුරුදු ගැමි වහරට සමීප යෙදුම්ය. උදාහරණ තුනක් දෙමින් මෙය පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)